# සම්භාව්‍ය සිංහල සාහිත්‍යයේ බෞද්ධ සාරධර්ම

(අමාවතුර, බුත්සරණ, දහම්සරණ,
සඟසරණ ඇසුරෙන්)

දර්ශන විශාරද උපාධිය සඳහා, කැලණිය විශ්ව විද්‍යාලයේ
සිංහල අංශය වෙත ඉදිරිපත් කැරෙන,
පර්යේෂණ නිබන්ධනය.

ලි. ප. අං. පර්/ප්‍ර/ද්වි/93/02

ඉත්තෑපාන ධම්මාලංකාර ස්ථවිර

## ග්‍ර න්ථ සා ර ය

### I පරිච්ඡේදය

ප්‍රාග්බෞද්ධ සමයේ ලාංකෙය සමාජය විවිධ ජනකොටස්-වලින් යුත් සංකීර්ණ සංයුතියක් සේ සැලකීමට පුළුවන. ආදිවාසීන්, මෙරටට පැමිණ ජනපද පිහිටුවා ගත් ආර්යයන්, වෙළඳ කටයුතු සඳහා පැමිණියවුන්, දේශපාලන, ආර්ථික, සාමාජික, අවශ්‍යතා මත පැමිණි ආගාමිකයන් එහි අන්තර්ග්‍රහණය වූ බව දක්නට ලැබෙන හෙයිනි.

මොවුන්ගේ ආගමික ඇදහිලි සහ විශ්වාසයන් කෙබඳුදැයි නිශ්චය වශයෙන් සඳහන් කිරීමට ප්‍රමාණවත් සාධක දක්නට නැත. වංශකථාගත තොරතුරු ස්වල්පය සමකාලීන ජාත්‍යන්තර හා දේශාන්තර ආගමික තත්වයන් සමග සසඳා බැලීමෙන් යම් යම් අනුමාන වෙත එළඹිය හැකි ය. වංශකථාවල එන තොරතුරු, පශ්චාත්කාලීන සටහන් මෙන් ම උක්ත ප්‍රස්තුතය පිළිබඳ ව විද්වතුන් ඉදිරිපත් කොට ඇති පර්යේෂණාත්-මක අදහස් සහාය කොට ගැනීමෙන් සමාජය මෙන් ම සමාජගත ආගමික භාවය ද සංකීර්ණ වූවක් සේ පෙනේ.

මෙසමයෙහි යකුන් ඇදහීම, මළවුන් පිදීම, වෘක්ෂ වන්දනාව, ලිංග වන්දනාව, පැවති බවටත්, ජෛනාගම, බ්‍රාහ්මණාගම, සහ විවිධ දර්ශන වෙත නැඹුරු වූවන් ද සිටි බව දක්නට ලැබේ. තන්ත්‍ර විශ්වාසය ද කිසියම් ප්‍රමාණයකින් පැවති බව අනුමාන කළ හැකි ය. බෞද්ධ භික්ෂූන් හෝ බුදුදහම පිළිබඳ සඳහන් කිසිවක් නැතත්, බුදුන්ගේ ලංකා ගමන්, බුදුදහම ව්‍යාප්ත ව පැවැති ඉන්දියාවෙන් පැමිණි සංක්‍රමණිකයන්, ජනාවාස පිහිටුවා ගත් ආර්යයන්, ඔවුන්ගේ ආවාහ විවාහ තොරතුරු, වෙළඳුන් ගැන විමසා බැලීමෙන් ලාංකේය සමාජය තුළ බුදුසමය පිළිබඳ දැන හැඳිනීමක් මේ යුගයෙහි තිබෙන්නට ඇතැ යි සිතිය හැකි ය.

පුස්තකාලය
කැලණිය විශ්වවිද්‍යාලය (ශ්‍රී ලංකාව)
කැලණිය.

මේ සංකීර්ණ ආගමික විශ්වාසයන් අතර එකක්වත් උස් පහත් තත්වයක පැවති බවක් දක්නට නැත. එක් එක් ලබ්ධිය ගරුකළවුන්ගේ සංඛ්‍යාත්මක වෙනස්කම් සමහර විට පවතින්නට ඇත. නමුත් රාජ්‍ය මට්ටමේ හෝ ජාතික මට්ටමේ ලබ්ධියක් නො වූ බව පෙනී යයි. තම තමන්ගේ ඇදහීම් නිදහසේ සිදු වූ අතර රාජ්‍ය අනුග්‍රහය ඒ සියල්ලන්ට ලැබුණු බව ද පෙනී යයි.

## 2 පරිච්ඡේදය

### ආගමික අදහස් අතින් සංකීර්ණ සමාජයක් පැවති

ශ්‍රී ලංකාවේ සංවිධානාත්මක ආගමික සමාජයක් පිළිබඳ තොරතුරු හමු වන්නේ ක්‍රි.පූර්ව 3 වන සියවසේ මැද භාගයේ පටන් ය. මෙයට තුඩු දුන් වංශකථා, අට්ඨකථා, සෙල්ලිපි, පුරාවිද්‍යාත්මක සාධක මගින් තහවුරු වන මෙම ඓතිහාසික සිද්ධිය නම් මිහිඳු මාහිමියන් විසින් මෙරට බුදුසසුන පිහිටුවීම යි. භක්තියට නොව බුද්ධියට මුල් තැන දෙමින් මෙරටට හඳුන්වා දුන් බුදුදහම ඉතා ශීඝ්‍රයෙන් මෙරට පැතිර ගියේය. බුදුදහම ප්‍රචලිත කිරීම සඳහා ක්‍රියා කළ ධර්මදූතයන් වහන්සේලා ඒ සඳහා දේශනා පැවැත්වීම පමණක් නො ව විශාල කාර්ය සම්භාරයක් ද ඉටු කළ වග පෙනේ. ආරාම ප්‍රතිග්‍රහණය, දේශීය භික්ෂු ශාසනයක් සහ භික්ෂුණී ශාසනයක් ආරම්භ කිරීම, බෝධි රෝපණය හා සර්වඥ ධාතූන් වහන්සේලා වැඩමවීම සහ සිංහල භාෂා සාහිත්‍යය පෝෂණයට පදනම දැමීම වැනි දේ ඒ අතර ප්‍රධාන තැනක් ගනී. ඒ අනුව බුදුසසුන පිහිටුවීම, රටවාසීන්ගේ මුළුමහත් ජීවන රටාව බෞද්ධ චින්තනය යටතේ සංවර්ධනාත්මක නවමගකට යොමු කළ මහා පරිවර්තන කාර්යයක් ද විය.

## 3 පරිච්ඡේදය

බුදුදහමේ සම්ප්‍රාප්තියෙන් පසු මෙරට භාෂා සාහිත්‍යයේ සහ අධ්‍යාපනයේ විශාල උන්නතියක් ඇති වූ බව පෙනේ. හෙළටුවාකරණය, සිගිරි පද්‍ය සමුදාය, සියබස්ලකර, සිඛවළඳ හා සිඛවළඳවිනිස, දම්පියාඅටුවාගැටපදය යන නිර්මාණවලින් ද වංශකථාදියෙහි සඳහන් ඓතිහාසික තොරතුරුවලින් ද ඒ බව තහවුරු වෙයි. මහාවිහාරය, අභයගිරිය, ආයතන වටා දක්නට ලැබෙන පුවත්වලින් මෙරට අධ්‍යාපනික තත්වය පිළිබඳ තොරතුරු රාශියක් අනාවරණය කර ගත හැකි ය.

සාහිත්‍ය කෘතියක් වශයෙන් අගය කළ හැකි දැනට හමු වන පැරණි ම ගද්‍ය කෘතිය වශයෙන් සැලකෙන ගුරුළුගෝමීන්ගේ අමාවතුර පොළොන්නරු සමයට අයත් වූවකි. බුදුසිරිත තේමා කොට ගෙන රචිත මෙම කෘතිය බුදුරදුන්ගේ පුරිසදම්මසාරථී ගුණය ධ්වනිත කිරීමේ අභිලාෂයෙන් රචිත වූවකි. එයට සැසඳෙන බුදුසිරිතට සම්බන්ධ කථා මුල් කොට ගත් පරිච්ඡේද සොළසකින් ග්‍රන්ථය පරිමිත ය. බෝසත්සිරිත, බුදුසිරිත, හා එම කථාත් මාධ්‍යයෙන් හැකි තාක් බෞද්ධ සාරධර්ම විදහා දැක්වීම මෙයින් අදහස් කොට තිබේ.

## 4 පරිච්ඡේදය

අමාවතුර, බුදුසිරිත ප්‍රධාන කාණ්ඩ දෙකක් යටතේ නිර්මාණය කොට ඇත. ඒ බෝසත්සිරිත හා බුදුසිරිත වශයෙනි. බෝසත්සිරිත ස්වසන්තාන දමන නමින් ද, බුදුසිරිත පරසන්තාන දමන නමින් ද හඳුන්වා ඇත. මේ කොටස් දෙක විස්තර කිරීමේ දි ගුරුළු-ගෝමී පඬිවරයා ආදි පාලි ග්‍රන්ථවලට පමණක් සීමා වූ බව නො පෙනේ. බෝසත් සංකල්පය හා බුද්ධ සංකල්පය සංවර්ධනයට පත් වීමේ දි විකාශයට පත් වූ සේ සැලකෙන බෝසත් උපත, සතර පෙරනිමිති, අභිනිෂ්ක්‍රමණය, මාරයුද්ධය, පිළිබඳ අටුවාගත සාම්ප්‍රදායික බුදුසිරිතට අදාළ විස්තර රාශියක් ඉදිරිපත් කොට තිබේ. අමාවතුර බෝසත්සිරිත සුමේධ අවදියෙන් පටන් ගෙන වෙසතුරු අත්බැවින් චුත ව තුසිපුර ඉපදීමෙන් අවසන් වෙයි. බුද්ධත්වය පතා ඊට අදාළ චරණධර්මයන් අනන්තාපරිමාණ කාලයක් පිරිය යුතුය යන මතයෙහි පිහිටා අනේක ජාතිවල එය පිරූ සැටි සිහි ගන්වන ජාතක කථා ගෙන හැර දක්වා ඇති අතර, එ මඟින් සසර දිත් බොහෝ පුරුෂයන් දමනය කළ අයුරු දක්වා තිබේ. කෙසේ වෙතත් බුදුසිරිතට පූර්විකාවක් වශයෙන් බෝසත් සිරිත දක්වා ඇත.

සිද්ධාර්ථ කුමාරෝත්පත්තියේ සිට බුදුබව ලබා දෙව්රම් වෙහෙර වැඩ විසීම දක්වා තොරතුරු ඇතුළත් දෙවන පරිච්ඡේදය ස්වසන්තානදමන නමින් හඳුන්වා ඇත. අනන්තාපරිමාණ කාලයක්

ශෛරාත්තරාභ්‍යාස වශයෙන් ප්‍රගුණ කළ චරණ ධර්මයන්හි ඵල ප්‍රාප්තිය බුද්ධත්වය බව මේ බුදුසිරිත කොටසින් පෙන්වා දී ඇත. මේ කොටස නිර්මාණය කොට ඇත්තේ සාම්ප්‍රදායික බුදුසිරිත ඇසුරු කරමිනි. ඒ නිසා මාරයුද්ධ, ආශ්චර්ය අද්භූත සිදුවීම් ආදියෙන් බුදුසිරිත බැහැර වී නැත. බුද්ධත්වය පරම පවිත්‍ර චිත්ත විශුද්ධිය පිළිබිඹු වන අවස්ථාවක් කොට දැක්වීමේ අභිප්‍රාය අනුව බුදුසිරිත නිරූපිත පරිච්ඡේදය ස්වසත්තානදමන තමින් හැඳින්වීමට පාදක වූ බව පෙනේ. එපමණක් නොව බුද්ධත්වයෙන් ලබා ගත් මෙකී පතිරූපතාව පුරිසදම්මසාරථි භාවයේ පදනම වශයෙන් ධ්වනිත කිරීම ද අපේක්ෂා කරන්නට ඇත.

5 පරිච්ඡේදය
-----------

සාරධර්ම සංකල්පය ඉපැරණි වූවක් මෙන් ම, පෙර අපර දෙදිග දාර්ශනිකයන්ගේ සහ ශාස්තෘවරුන්ගේ අවධානයට ලක් වූවකි. මිනිසාගේ අභ්‍යන්තරයෙහි ප්‍රවර්තනය වන සද්ගුණය සාරධර්මය නම් වන අතර ප්‍රඥාව, ධෛර්යය, මිතාචාරය, යුක්තිය, එහි අංග ලක්ෂණ බව ග්‍රීක දාර්ශනිකයන්ගේ මතය යි. වේදයෙහි ද සාර ශබ්දය යෙදී ඇති අතර, එය සදාචාර සංකල්පයක් ලෙස ප්‍රාග් බෞද්ධ යුගයෙහි පැවති බව පෙනේ. විමුක්තිය ම සාරය වන අතර විමුක්ති මාර්ගය වූ ප්‍රඥාව හා චරණයන් සාරධර්ම වශයෙන් බෞද්ධ සංකල්පයෙහි ලා සැලකේ.

අපරදිග දාර්ශනිකයන් අනුගත ක්‍රමවේදයට අනුව ඔවුන් සිය දාර්ශනික විෂයයන් ලෝකය, ඥානය හා චර්යාව යන කොටස් යටතේ විග්‍රහ කොට ඇත. බෞද්ධ සාරධර්ම විග්‍රහය වුව ද මෙකී ක්‍රමවේදයට අනුව කළ හැකි වුවත් අනීශ්වරවාදි පදනමක් ඇති එහි විශේෂතා දක්නට ලැබේ. බෞද්ධ සාරධර්ම හා බැඳුණු සංකල්ප ප්‍රපංචයක් ද දක්නට ඇත. විශ්වය, පුනරුත්පත්තිය, කර්මය හා විමුක්තිය යි. මේ අනුව බෞද්ධ සාරධර්ම පුද්ගල සංවර්ධනය සහ විමුක්තියත් සමාජාභිවෘද්ධියත් සලසා ගත හැකි ය.

මේ නිසා බෞද්ධ සාරධර්ම පිළිබඳ යථාවබෝධය ලබා දීමේ අරමුණ සහිත ව සාම්ප්‍රදායික සිංහල සාහිත්‍ය රචකයන් බුදුසිරිත, බුදුදහම ඇසුරු කොට සාහිත්‍යකරණයට පෙළඹී ඇත. අමාවතුර රචක ගුරුළුගෝමී පඬිතුමා මෙය කාලීන අවශ්‍යතාවක් වශයෙන් ද සලකා සිය ග්‍රන්ථය රචනා කොට ඇති බව අමාවතුර විමසා බැලීමෙන් දැකිය හැකි ය. බෝසත් සිරිත හා බුදුසිරිත දක්වමින් සාරධර්ම පාරගත බුදුරදුන් ලෝක සංග්‍රහයෙහි පරමපතිරූපතාවෙන් පරිපූර්ණ වූ අයුරු නිරූපිත ය. ගහපතිදමන පරිච්ඡේද උපාලි ගහපති කථාවෙන් හා එහි ම දණ්ඩකාරණ්‍යය, කාලිංගාරණ්‍ය, මෙධ්‍යාරණ්‍ය, මාතංගාරණ්‍ය, වල් වූ පරිදි දැක්වෙන අතුරු කථාවලිනුත් ආගම් පිළිගැනීමේ දී පෙරටු කොට ගත යුතු විචාර බුද්ධිය, ආගමික සහනශීලය, පරිත්‍යාගයෙහි අගය,

පරිත්‍යාගයෙහි යෙදිය යුතු අයුරු , කුලමානයෙහි ආදීනව, මනුෂ්‍යත්වය අගය කිරීම, සමානාත්මතාව, ස්වච්ඡන්දය , උට්ඨාන වීර්යය, පුරුෂ-කාරය, අනර්ථකාරී හිංසාවෙහි ආදීනව දක්වෙයි. දේශපාලන සදාචාරය, අහිංසාව, කරුණාව, මෛත්‍රිය වැනි සාරධර්ම රාශියක් බ්‍රාහ්මණ දමන පරිච්ඡේදයෙන් අවධාරණය කොට ඇත. විනීත බව, ආචාර්ය භක්තිය පුද්ගල සංවර්ධනය, මානසික පුනරුත්ථාපනය වැනි කරුණු රාශියක් අංගුලිමාල දමනයෙන් ද, කර්මය, පුනරුත්පත්තිය, අනිත්‍යතාව වැනි ධර්මයන් අනුව ලෝකය දෙස යථාර්ථවාදී ව බැලීමෙහි අගය මානවක දමනයෙන් ද, විමුක්තිය ලැබීමේ පරමාර්ථයෙන් විනා ප්‍රාතිහාර්ය පෑම් වැනි නිසරු දෙය ලැබීමේ අදහසින් බුදුදහම අනුගමනය කිරීම අර්ථවත් නො වන බවත්, දිගම්බර දමනයෙන් පෙන්වා දී ඇත.

වෛරය සංසිඳවීම සඳහා එකම පිළියම ක්ෂාන්තිය බව ජටිල දමනයෙන් පෙන්වා දෙයි. නොපසුබස්නා වීර්යය, සමත්තේයනය සත්‍යාවබෝධයට මාර්ගය තාපස දමනයෙන් ප්‍රකට වෙයි. යුද්ධයේ විනාශකාරී බව, මිනිස් සම්පත ආරක්ෂා වීමේ අගය භික්ෂු දමනයෙන් ද ක්‍රෝධයට මෛත්‍රියයෙන් පිළිතුරු දීමේ ශ්‍රේෂ්ඨ ප්‍රතිඵල නාග දමනයෙන් ද රුදුරු සත්තානවල පරිවර්තනයක් මෛත්‍රියයෙන් ඇති වන සැටි යක්ෂ දමනයෙන් ද, පින පින්වල ඇති සැටි අසුර දමනයෙන් ද, උත්තානීක රණය වෙයි. මෙකී විශේෂ සාරධර්ම ඇතුළු ව කුදු මහත් බෞද්ධ

සාරධර්මයන්හි උපයෝගතාව ජනතාවට වටහා දීම අමාවතුර ග්‍රන්ථයේ පරමාර්ථය බව සිතිය හැකි ය.

## 6 පරිච්ඡේදය

පිහිට, ආරක්ෂාව, රැකවරණය, සරණ සංකල්පයෙන් අදහස් වෙයි. බිය, සන්ත්‍රාසය, පදනමින් බොහෝදෙන එයින් ආරක්ෂා වීමට ගස්,ගල්,වන ,චෛතිය ආදිය සරණ යාම ඉපැරණි සරණ සංකල්ප යටතේ සිදු විය. මෙය උතුම් සරණයක්, ආරක්ෂාවක් නො වන අතර බුදුන් දහම් සඟුන් සරණ යාම උතුම් සරණය වන අතර, එමගින් සියලු දුක් බිය සංසිඳෙන බව බෞද්ධ සරණ සංකල්පයෙන් අපේක්ෂිත ය. අදෘෂ්‍යමාන බලවේග ගැන සිතා අනුන්ට ගැති වී පිළිසරණ පැතීමට වඩා තුනුරුවන්හි ගුණ දැන තිසරණගත වීමෙන් සදාචාරාත්මක සාරධර්ම දියුණු කිරීමට ප්‍රායෝගික ව පෙළඹෙයි. ඒ හේතුවෙන් සියලු දුක් බිය පහ කොට විමුක්ති සුවය ලැබිය හැකි ය.

මේ නිසා සම්භාව්‍ය සිංහල සාහිත්‍ය නිර්මාණය කළ රචකයන් තම කෘති තුළින් තෙරුවන් ගුණ වැනීමට පෙළඹුණ බව සිතිය හැකි ය. විශේෂයෙන් තිසරණ ග්‍රන්ථ මාලාවෙන් බුදුගුණ,දහම්ගුණ, සඟගුණ වැනීම සිදු කොට ඇත්තේ එ මගින් පාඨකයාගේ සිත්හි ප්‍රසාදය ඇති කොට සාරධර්මයන්ට යොමු කිරීම සඳහා ය.

බුත්සරණ නම් බුද්ධචරිත කාව්‍යය රචනා කළ විද්‍යාචක්‍රවර්ති සිය කෘතියෙන් බුදුගුණ එක් එක් ආකාරයෙන් ගෙන හැර දක්වමින් එහි ගුණ දැක බුත්සරණ යා යුතු බව පෙන්වා දෙයි. තිසරණගමනයෙහි ඵල, නවඅරහාදි බුදුගුණ, බුදුරදුන්ගේ දේශනා විලාශය, රූපකාය සම්පත්තිය, ධර්මකාය සම්පත්තිය, වෙන් වෙන් ව ප්‍රකට වන සේ බුදුගුණ සංග්‍රහ කොට දක්වයි. සිය ගණන් උපමා රූපක යොදා ගනිමින් කාව්‍යාත්මක ව , ශ්‍රැතිරමණීය බසකින් වර්ණනා කොට ඇති බුදුගුණ, පාඨකයගේ සිත්සතන් පහන් කිරීමට සෑබෑ අනුබලයක් ලබා දෙයි. ලෝකය සඳහා බෝසත්තුමා කළ හැකි සෑම පරිත්‍යාගයක් ම කළ බව සනාථ කිරීමට මෙන් බුත්සරණ ග්‍රන්ථයේ අවසාන පරිච්ඡේදය වශයෙන් වෙස්සන්තර ජාතකය ඉදිරිපත් කොට තිබේ. එවැනි ගුණාංගසංගත වීම ආත්ම විමුක්තියට මෙන් ම සමාජ ශුභසිද්ධියටත් හේතු වන අයුරු නුවණින් වටහා ගත හැකි වන අයුරින් ශ්‍රද්ධා ප්‍රඥා මූලික ව බුත්සරණ යාමේ අගය පෙන්වා දීම මේ ග්‍රන්ථයේ අදහස වූ බව පෙනේ.

## 7 පරිච්ඡේදය

කොතෙක් පැවසුවත් බුදුගුණ නිමවිය නොහැකි බව ප්‍රකාශ කරන බුත්සරණ කතුවරයා තමා තෝරා ගත් බුදුසිරිතට සම්බන්ධ හැම පුවතකින් ම උත්වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව ඇති කරවීමට අවස්ථාව සලසා ගනී. බුදුන්ගේ රූපකාය, ධර්මකාය, වචනවිලාස, ප්‍රාතිහාර්ය මහිම

යන හැම අංශයක් වර්ණනා කරමින් උන්වහන්සේගේ ගුණ දක්වා ප්‍රසාදය ජනිත කරවීමේ අපේක්ෂාව විනා, බුදුන්ගේ අතිමානුෂිකත්වයක් ගොඩනගා අන්ධභක්තිය දැනවීම, මේ රචකයාගේ අභිප්‍රාය වූ බවක් නො පෙනේ.

ශ්‍රද්ධාවෙන් බුදුන් දැක, ලෝකාර්ථ චර්යාවෙන් අනන්තාපරිමාණ ජනතාව ඓහලෞකික පාරලෞකික වශයෙන් සුවපත් කළ සැටි නුවණින් වටහා ගැනීමට මග පාමින්, බෞද්ධ සාරධර්ම සමාදානයෙහි ඵලදායිත්වය වටහා දීමට සැසඳෙන අයුරින් බුත්සරණ නිර්මාණය වී තිබෙන අයුරු, එක් එක් පරිච්ඡේද විමසා බැලීමෙන් වටහා ගත හැකි ය.

අමාවතුර සංකලනයේ දී දුටු පරිදි බෞද්ධ සාරධර්ම-යන් කෙරෙහි යොමු වීමට පදනම් වුයේ යයි සිතිය හැකි සංකල්පප්‍රපංචය මෙහිදී ද දක්නට ලැබේ. විශ්වකාල සංකල්පය, කර්ම සංකල්පය හා පුනරුත්පත්ති සංකල්පය ද, විමුක්ති සංකල්පය ද ධ්වනිත වන අයුරු ලොක විවරණ, කල්ප විනාශය, ඊට හේතු වූ කර්මය, බුත්සරණ යාම ඊට ඇති පිළියම බව මේ බුදුගුණ සංග්‍රහයෙන් ද ප්‍රකාශ වෙයි. බුත්සරණ යාම පමණක් නො ව තෙරුවන් අරභයා පවත්වන පුද පූජා අගය කිරීම ද, කර්ම සංකල්පය පදනමින් සාරධර්මයනට යොමු කිරීමක් බව පෙනී යයි. පුද පූජාවල නිරතවීමට අවශ්‍ය සියලු දෙනාට යථාශක්තින්

එහි නිරත විය හැකි අතර, එහි ලා සම්පත් මහත්වය නොව ශ්‍රද්ධා මහත්වය ම ඵලදායක ය. මිනිස් ගැටළු විසඳා ගැනීමේ දී බුද්ධි සම්පන්න වීම, කරුණා මෛත්‍රී පෙරදැරිව මානසිකත්වය වටහාගෙන අසිරුවට පත්වුවත් සුවපත් කිරීමේ අගය පටාචාරා පුවතින් ද, ශ්‍රද්ධාව, ධර්මකුශල බව, සත්‍යය, ප්‍රඥාව ජීවත්වීම යන සාරධර්මයන් අළලා නිර්මාණය වී ඇති ආලවක කථාව ද මිනිස් ජීවිත හැඩගැන්වීමට කදිම මග පෙන්වීමකි. විසාලාවේ ගණතන්ත්‍ර රාජ්‍ය පිළිබඳ විස්තරය දේශපාලන සදාචාරය මෙන් බෞද්ධ පදනමක් ඇති රාජ්‍යයක ලක්ෂණ විස්තර කරන්නකි.

මෙසේ බෝසත්සිරිත්, බුදුසිරිත හා බෞද්ධ කතා සහ ධර්මෝපදේශ තේමා කොට ගත් බුද්ධචරිත කාව්‍යයක් වූ බුත්සරණ මිනිසාට කාය වාක් මනඃ සදාචාරයේ පිහිටා පුද්ගල සංවර්ධනය සකසා ගෙන සමාජයීය අභිවෘද්ධියට කොටස්කරුවකු වී ආත්ම විමුක්තිය සලසා ගැනීමට යෝග්‍ය කුදු මහත් බෞද්ධ සාරධර්ම රාශියක් ඉදිරිපත් කොට ඇති සැටි දැක්විය හැකි ය.

8 පරිච්ඡේදය

දහම්සරණ යාමෙහි අගය දක්වා දහම්සරණ යායුතු බව නිර්දේශ කරමින් ලියූ කෘතියක් වශයෙන් දහම්සරණ ග්‍රන්ථය හැඳින්විය හැකි ය. ආකෘතික වශයෙන් සහ අරමුණු වශයෙන් දක්නට

ලැබෙන සදෘශතා හේතුවෙන් මෙය ධම්සරණ කතුවරයාගේ ම කෘතියෙ-කැ යි පවසතත් එය නිශ්චිත ව තහවුරු කිරීමට ප්‍රමාණවත් සාධක නො මැත. බුද්ධචරිතය, ජාතක කථා, දහම්සරණ වර්ණනා යන ප්‍රධාන ක්ෂේත්‍ර තුනක් යටතේ දහම් සරණ නිර්මාණය වී තිබේ. සුමේධ අවදියේ සිට බුද්ධත්වය දක්වා පාරමිතා සම්පාදනය ප්‍රථම කොටසින් ද, බෝස-තුන්ගේ ධර්මකාමය ජාතකකථා සංග්‍රහයක් වූ දෙවන කොටසින් ද, කථා සංග්‍රයක් වූ තෙවන කොටසින් ධර්මවර්ණය ම ධර්මශරනය වන අයුරු ද විස්තර වෙයි.

බුදුන් බුදු වී පසක් කළ ධර්මය ධර්මය යන්නෙන් අදහස් වන අයුරු දහම්සරණ ග්‍රන්ථය ආරම්භයෙහි ම දක්නට ලැබේ. එයින් නවලෝකුත්තරධම්ම ගැනෙන බව කතුවරයා ධම්ම යන්නට සපයා ඇති අර්ථකථනවලින් පෙනේ. ධර්ම සංකල්පයෙන් අදහස් කරන්නේ කුමක් දැ යි හඳුනා ගැනීමට පෙරදිග මෙන් ම, අපරදිග වියතුන් ද, උත්සාහ දරා ඇත. ඒ අනුව කාලාන්තරයක් පුරා ඔව්හු විවිධ අර්ථ වලට ධම්ම යන පදය පරිවර්තනය කොට තිබේ. බෞද්ධ චින්තනයෙහි ලා කේන්ද්‍රිය සංකල්පයක් වූ ධම්ම යන්නෙහි පෘථුලාර්ථය එම පරිවර්තිත පදවලින් ලබා නොදෙන බවට විවේචන පළ වී තිබේ.

මේ අතර අට්ඨකථාවල දක්නට ලැබෙන ධම්ම යනු නවලෝකෝත්තර ධම්ම නම් වෙයි, යන අදහස කෙරෙහි ගෛගර්

යුවල සැලකිලිමත් වී ඇති අතර අයි.බී.හෝනර් මෙනෙවිය ඒ ගැන ගැඹුරින් සාකච්ඡා කොට තිබේ. අට්ඨකථාවල මෙන් ම සම්භාව්‍ය සිංහල සාහිත්‍ය කෘතිවල දක්නට ලැබෙන පරිදි මුළු මහත් බුද්ධ දේශනාව සහ එමගින් අපේක්‍ෂිත මග-ඵල- නිවන් ධම්ම සංකල්පයෙහි අන්තර්ග්‍රහණය වී ඇති සැටි විස්තර වෙයි. මේ අනුව බුදුදහමෙහි සඳහන් පටිපත්ති-පටිවෙධ- දෙක ධම්ම සංකල්පයෙහි ඇතුළත් ය. පටිපත්තිය පටිවේධයට ත්, පටිවේධය සියලු දුක් ව්‍යුපසමනයට ත් හේතු වන බැවින් ධර්මය සරණයක් කොට සැලකේ.

## 9 පරිච්ඡේදය

ධර්මචරණය, ධර්මකාමය, ධර්මශරණය යන ප්‍රධාන ශීර්ෂ තුනක් යටතේ කරුණු සංග්‍රහ කොට ඇති දහම්සරණ ග්‍රන්ථයෙන් බෞද්ධ සාරධර්ම ප්‍රායෝගික ව පුහුණු කිරීම, ඒ සඳහා දැඩි කැමැත්තක අවශ්‍යකත්වය මගින් තමන්ගේ ම ආරක්‍ෂාව සැලසෙන අයුරු බුදුසිරිත ජාතකකථා නොයෙක් නොයෙක් පුද්ගල චරිත මාධ්‍යයෙන් පෙන්වා දී තිබේ. බුදුසිරිත විස්තර කරමින් සුමේධ තාපස තුමා දසපාරමිතා පිරීමට අවධානය යොමු කිරීමේ පුවතට විශේෂ තැනක් දී ඇත. එමගින් පුද්ගලයා සන්තානගත අභිවෘද්ධියෙන් පරමෝත්කෘෂ්ට තත්වයට පත් වන අයුරු පැහැදිලි වෙයි. ත්‍යාගය දියුණු කරන්නාට ලෝකය සඳහා වස්තු සම්පත් පමණක් නො ව අංගප්‍රත්‍යංග සහ ජිවිතය වුව ද

කැප කළ හැකි ය. දුසිරිතට බියලජ්ජා ඇති මිනිසා සුසිරිත රැක ගත යුත්තේ තනි ඇසක් රැක ගන්නාක් මෙනි. කම්සැප පරිහරණයේ දී එහි ආදීනව පැත්ත ද නුවණින් සලකා සංවේගවත් වීම, ඒවා පදනම් කොට ගත් සට්ටනවලින් දුරුවීමට හේතු වෙයි. ශරීරයෙන් ඉවත් නො වන සෙවණැල්ල මෙන් ජීවිතයෙන් වීරියය බැහැර නො කළ යුතු ය. ඉවසීම, සත්‍යය, අධිෂ්ඨානය, මෛත්‍රිය, අත්තග්‍රාහී නො වීම අර්ථවත් සහජීවනයට අත්‍යවශ්‍ය ය.

පාරමිතා නමින් පෙන්වා දෙන මේ සද්ගුණ සමුදාය පුද්ගලයාගේ අභිවෘද්ධිය සඳහා පමණක් නො ව විවාදාත්මක මිනිස් ගැටළු විසඳාලීමට තුඩු දෙන බව ද පැහැදිලි වෙයි. එය සද්සමාජයක පදනම ද වන්නේ ය. නිෂ්ක්‍රිය නො වූ ව්‍යවහාරික සමාජයක් පිළිබිඹු කරන ජාතකකථා සමුදාය තුළින් සදාචාරාත්මක දුරාචාරාත්මක පැවැත්මේ ගැටීම් පිළිබිඹු කරන අතර ම, සදාචාරාත්මක බව ම අත්තසරණය බව පෙන්වා දෙයි. අත්තසරණව අනන්‍යසරණව ක්‍රියා කිරීමෙන් ම ලැබිය හැකි ජයග්‍රහණ තරා සදාචාරය වෙනුවෙන් කැප වීමේ අවශ්‍යතාව කෙරෙහි කෙතරම් ආශාවක් උනන්දුවක්, දැක්විය යුතු ද යන්න එමගින් පිළිබිඹු කොට තිබේ. බෝසතුන්ගේ ධර්මකාමය පිටිබිඹු කිරීමට දක්වා ඇති එම කථාමාධ්‍යයෙන් පාඨකයා තුළ ඇති කරන්නේ එම පෙළඹ වීම යි.

පුස්තකාලය
කැලණිය විශ්වවිද්‍යාලය (ශ්‍රී ලංකාව)
කැලණිය.

මහත් උද්‍යොගයෙන් හා ලැදිකමෙන් ධර්මසරණ යන පුද්ගලයාට එයින් ලැබෙන්නේ ආරක්‍ෂාවකි. ඓහලෞකික, පාරලෞකික වශයෙන් මුහුණ දිය යුතු සියලු දුක්පීඩාවලින් ආරක්‍ෂා වීමට නම් ධර්මය ම හැර වෙනත් පිහිටක් නො මැත. ධර්මචරණය නිසා ඒ ධර්මයෙන් පිහිට ලැබුවන්ගේ පුවත් මඟින් තහවුරු කොට ඇත්තේ ධර්මයෙන් ධර්මචාරී පුද්ගලයා සුරැකෙන ආකාරය යයි ඉතා සියුම් ආකාරයෙන් සාරධර්මයන් කෙරෙහි පාඨකයාගේ සිත් සතන් යොමු වන අන්දමින් දහම්සරණ නිර්මාණය වී ඇති බව දක්නට ලැබෙයි.

## 10 පරිච්ඡේදය

තිසරණ ග්‍රන්ථ මාලාවේ අවසන් කෘතිය සඞසරණ යි. සංඝයා සරණ යාමේ අගය නිර්දේශිත බැවින් සහ බුත්සරණට හා දහම්සරණට අනුගත බවක් දක්නට ලැබෙන නිසා ඒවා ඒකකර්තෘක කොට සලකන බවක් පෙනේ. ප්‍රතිභාව, ශෛලිය, භාෂාව යන කරුණු අතින් ග්‍රන්ථත්‍රයෙහි දක්නට ලැබෙන විශේෂතා අනුව බලතොත් ඒවා ඒකකර්තෘක යයි කීමට තවත් බොහෝ සාධක සෙවිය යුතු බැව් පෙනේ.

පොදු සංඝගුණ වර්ණනා සහ භික්‍ෂු චරිත වර්ණනා වශයෙන් සඞසරණ ප්‍රධාන කොටස් දෙකකට බෙදා දැක්විය හැකි ය. සඞගුණ වැනීමේ දී පෙළ, අටුවා, ප්‍රකරණ, ග්‍රන්ථයන්හි දක්නට ලැබෙන සංඝගුණ

වර්ණනාවල ආභාසය ලබා ඇත. චරිත වර්ණනා කොටසට සැරියුත් චරිතය ආදි කොට ඇති දෙස්විදෙස් භික්ෂු චරිත තිස්නවයක් ඇතුළත් ව තිබේ. මේ සියලු චරිත නවමගක් අනුව ඉදිරිපත් කිරීම මෙහි ලා දක්නට ලැබීම විශේෂත්වයකි. එනම් චරිතයක අනුපිළිවෙළ කථාව දැක්වීම මෙහිදි ත් අපේක්ෂා කොට නො තිබීම ය. චරිතයෙහි කිසියම් විශේෂිත සිද්ධියක් අළලා එමගින් එම චරිතයෙහි විශේෂ ගුණාංගයක් ප්‍රකට කිරීම එහි අරමුණ වී තිබේ. මෙවැනි ගුණ දැක දැන සංසරණ යාම අර්ථවත් වන අයුරු පෙන්වීමට අදහස් කළ බව පෙනේ.

සමුහාර්ථවත් 'සංඝ' යන පදය දෘෂ්ටිශීල ශ්‍රමණ ගුණයෙන් සමානත්වයට පත් සමූහයක් දැක්වීම බෞද්ධ සංඝ සංකල්පය තුළ විද්‍යමාන බව පෙනේ. ඒ අනුව බෞද්ධ භික්ෂු සංඝයා වහන්සේ විශේෂිත ආකල්පවලින් මෙන් ම, අධ්‍යාත්මික ගුණ සමුදායකින් සමන්නාගත විය යුතු ය. උන්වහන්සේලා අත්තකිලමථානුයොග, කාමසුඛල්ලිකානුයොග යන උභයාන්තයට නො ගොස් මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කළ යුතු ය. එ මගින් ශීල, සමාධි, ප්‍රඥා යන ත්‍රිවිධ ශික්ෂණය ලබා මගඵල සාක්ෂාත් කළ යුතු ය. එයින් ආර්යත්වයට පත් වන උන්වහන්සේලා මගපල භේදය අනුව යුග වශයෙන් සතරකුත්, පුද්ගල වශයෙන් අටකුත් මෙකී මාර්ග ප්‍රතිපදාවට යොමු වූ හෙයින් සියලු භික්ෂු සංඝයා වහන්සේ අරියසාවක නමින් සැලකීමෙහි යෝග්‍යත්වය ද තිබේ.

මේ ශ්‍රාවකසංඝයා ආත්ම විමුක්තිය පමණක් නොතකන අතර, පශ්චිම ජනතාවගේ නිත්‍ය හිතසුව පිණිස ද බුද්ධ නියමය පරිදි චාරිකා කරමින් ගම් නියම්ගම් අසුරු කරමින් මග කියා දෙති. ආදර්ශයත්, අනුශාසනයත්, දෙක ම සංඝයා වහන්සේ වෙත පත් වන හෙයින් එය ජනතාවට සිය යහපත සකසා ගැනීමට යෝග්‍ය ආයතන-යක් වෙයි. එබැවින් සංඝසරණ යාමෙහි අගය වටහා ගැනීමෙන් ලෝකයාට ලබා ගත හැකි ප්‍රයෝජන ඉමහත් ය.

## II පරිච්ඡේදය

භික්‍ෂු චරිතාපදාන මඟින් උන්වහන්සේ මෙවැනි ආදර්ශ මෙවැනි අනුශාසනා ඇත්තාහ යන කරුණු සනාථ කිරීමෙන් එම ආදර්ශයත් අනුශාසනය ත්, ජනතාවට සරණක් බව පහදා ලීම කතුවරයාගේ අදහස වූ බව පෙනේ. භික්‍ෂු චරිතයක දක්නට ලැබෙන කායජීවිත නිරපෙක්‍ෂ වීර්යය අල්පේච්ඡතාව, පරහිතකාමීබව, ප්‍රත්‍යවේක්‍ෂා සහගත ජීවිතය අනුන් නොතළා දිවිපැවතුම් කරන ආකාරය මිනිසුන්ගේ උස්පහත්කම භේද භින්නතා නො තකා ඔවුන් යහමග ගැන්වීමට දක්වන උනන්දුව අධර්මය අවිනය ප්‍රතික්‍ෂේප කිරීමේ දි ජීවිතය ගැන හෝ නොතැකීම වැනි ගුණ පෙන්වා දෙමින් උන්වහන්සේලා වන්දනීය වූත්, පූජනීය වූත්, පිරිසක් බව පෙන්වා දි ඇත.

xxx

පියාපත් බර පමණක් ඇති කුරුළු ජීවිතයකට සම පැවැත්මක් ඇති ගෙහසිත අපේක්‍ෂා රහිත උත්වහන්සේලාගේ දිවි පැවැත්ම වනයෙන් වනයට හමා යන පවනකට සමාන ය. බුදුන් නො දුටු මිනිසෙකුට සඟරුවන් දැකීමෙන් ඒ වේශය හෝ සිහිකොට ගත හැකි ය. බුද්ධොත්පාද කාලයට පෙර හෝ ශාසනාන්තර්ධානයෙන් පසු හෝ නො ලැබිය හැකි සංඝදර්ශනය දුර්ලභ වූවකි. ඒ බුද්ධපුත්‍රයන් බව සිතා වඳින පුදන ජනයාට එමගින් දුකින් මිදී විමුක්ති සැප ලබා ගැනීමට අවස්ථාව සැලසෙයි.

සඟසසුන හැර වෙනත් කවර ආයතනයකින් හෝ සද්ධර්මය සුරක්‍ෂිත නො වෙයි. උත්වහන්සේලා නිධානයක් රකින්නාක් මෙන් සසුන ආරක්‍ෂා කරති. බුදුදහමෙන් මිනිසාට ලැබිය හැකි ඉහලොක පරලොක සුබසෙත දීර්ඝකාලීන ව ලබා ගැනීමට භික්‍ෂුශාසනය පරම ප්‍රතිෂ්ඨාව බව මේ අදහස් මගින් දක්වා තිබේ. ගිහි-පැවිදි සබඳතාවයේ පදනම සහ එමගින් ලැබිය හැකි විපුල ප්‍රයෝජන භික්‍ෂුචරිත මාධ්‍යයෙන් ඵවතින කිරීම සඟසරණ කතුවරයාගේ අදහස වූ බව පෙනේ.